

LH

# 5

# සෙන්සරය හා ප්‍රොසෙසරය

ඩිජිටල් කැමරාවේ ආලෝක සංවේදී තලය වන්නේ සෙන්සරයයි. එය නාභිතලයේ පිහිටා ඇති, ස්ථිර අංගයකි. සෙන්සරයේ කාචයට මුහුණ ලා ඇති පැත්තේ ක්‍ෂුද්‍ර කාච සමූහයක් ඇත. මෙම ක්‍ෂුද්‍ර කාචයන්ට යටින් කාචයෙන් ගෙනෙනු ලබන ආලෝකයට සාපේක්ෂව විද්‍යුත් සංඥා ඇති කරවනු ලබන ෆොටෝ ඩයෝඩ Photo (Diode) ඇත. සෙන්සරයෙන් සටහන් කරගන්නා වූ විවිධ ආලෝක මට්ටම් විද්‍යුත් සංඥාවලට හැරවේ. රූපයක් නොවන මේ විද්‍යුත් සංඥාවන් කැමරාවේ (එල්ඊඩී) LED තිරය මත දී හෝ පරිගණක තිරයක් මත දී රූපයකට පරිවර්තනය වී පෙනෙන්නට පටන් ගනී. ඡායාරූපයක් සෑදීමේ කාර්යය සෙන්සරයේ හා ප්‍රොසෙසරයේ සාමූහික කටයුත්තක් වෙතත් ව්‍යවහාරයේදී එය සෙන්සරයේ කාර්යයක් ලෙස සඳහන් කරනු ලබන්නේය.

### පික්සල් (pixcel)

රූපයක් බවට පත්වන්නට විභවයක් ඇති බයිනරි දත්ත ගොන්නකට පික්සලයක් යයි කියනු ලැබේ. එක් පික්සලයක් තුළ බිට්ස් (බයිනර් දත්තයකි) ගණනාවක් තිබිය හැකි ය. එක් පික්සලයක් තුළ ඇති බිට්ස් ගණන වැඩිවත්ම එයට වර්ණ මට්ටම් රැසක් දක්වන්නට හැකි වෙයි. බිට්ස් අටක් ඇති පික්සලයකට වර්ණ මට්ටම 256 ක් ($2^8$) දැක්විය හැකිය. රූපය සෑදෙන්නේ මෙම පික්සල් එකතුවීමෙනි.

### මෙගා පික්සල්

සෙන්සරය පුරා පික්සල් මිලියන ගණනකි. පික්සල් මිලියනයකට මෙගා පික්සලයක් (Mega pixcel) යැයි ව්‍යවහාර වේ. සෙන්සරක